# තනි පද-7

***වචන කිහිපයක් වෙනුවට යෙදිය හැකි තනි වචන තනි පද නම් වේ***

*උදා :-* අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

1) ශාක අනුභව කොට ජීවත්වන - ශාක භක්ෂක
2) මාංශ හා ශාක දෙවර්ගයම අනුභව කරන - සර්වභක්ෂක
3) ව්‍යාපාරයට යොදන මුල් මුදල - ප්‍රාග්ධනය
4) බුද්ධත්වයට පෙරුම් පුරන තැනැත්තා - බෝධිසත්ව
5) රජයට ගෙවිය යුතු බදු - අයබදු
6) තමා උපන් රට - මව්බිම
7) නිරතුරු කතා කරන - දොඩමළු
8) පාද බොහෝ ගණනක් ඇති - බහුපා
9) පොළොවේ ඛනිජ වර්ග ඇති ස්ථානය - නිධිය
10) සහමුලින්ම උපුටා දැමීම - මූලෝත්පාඨනය
11) තමා අවට ප්‍රදේශය - පරිසරය
12) පියා මැරූ තැනැත්තා - පිතෘඝාතක
13) මෑ බෝංචි වර්ග ඇතුළත් ශාක කුලය - රනිල
14) කුමන හෝ ස්ථානයක තනිව හැසිරෙන්නා - ඒක චාරියා
15) ගස මැද තිබෙන තද කොටස - අරටුව
16) කිසිම ආයුධයක් නැති - නිරායුධ
17) මසුන් අල්ලා ජීවත්වන්නා - ධීවරයා
18) රටක ප්‍රධානතම නගරය - අගනුවර
19) ඉතා සුළු මොහොතකින් - ක්ෂණිකව
20) නිදි නොලබා අවදියෙන් සිටීම - නිදිවැරීම